# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2238/35 - 2021 ජූලි මස 30 වැනි සිකුරාදා - 2021.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, වයඹ පළාතේ ආණ්ඩුකාරවර රාජා කොල්ලුරේ වන මා විසින් සාදන ලද පහත සඳහන් නියෝග මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

රාජා කොල්ලුරේ,
වයඹ පළාතේ ආණ්ඩුකාරවර.

2021 ජූලි මස 29 වන දින,
කුරුණෑගල දී ය.

නියෝග

1. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ක්‍රියාත්මක වූ දින සිට අවුරුදු තුනක් ඇතුළත එනම්, 1990 මැයි මස 11 වැනි දිනට පෙර, එකී ප්‍රාදේශීය සභා පනතේ 23 වන වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා සතු වී ඇති ලෙස සලකනු ලැබිය යුතු පාරවල් හා පටු මාවත්, එකී පනතේ 24 වන වගන්තිය යටතේ ස්ථිර සලකුණු සහ සීමා ලකුණු කිරීම ද එම පාරවල් හා පටු මාවත්වල සැලැස්මවල් පිළියෙල කිරීම කළ යුතු වී තිබුණ හෙයින් ද, නියෝගවල නියම කර ඇති ආකාරයෙන් ඒ පිළිබඳ දැන්වීම් පළ කිරීම ද කළ යුතු බවට නියම කර ඇතත්, මේ වන තෙක් ම ඒ සඳහා අවශ්‍ය නියෝග සාද නොමැති හෙයින් ද සහ එසේ දන්වීම් පළකළ යුතු කාලය මේ වන විට ඉක්මවා ඇති හෙයින් ද, මෙකී විශේෂ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින් ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාර කටයුතු කිරීමට වයඹ පළාතේ ප්‍රාදේශීය සභාවලට වැඩිදුර කාලයක් සඳහා අවසර දීමට සහ එකී පාරවල්වල සහ පටු මාවත්වල නාමාලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීමට අවශ්‍ය පටිපාටිය නියම කිරීම හා ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස මේ නියෝග ප්‍රකාශයට පත් කරනු ලැබේ. නියෝගවල අරමුණ

2. මෙම නියෝග වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙල කිරීම හා නාමලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පනතේ 24 වන වගන්තිය යටතේ ක්‍රියා කිරීමට අවශ්‍ය කාලය දීර්ඝ කිරීම

3. (1) 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු මෙහි මින් මතු ''පනත '' යනුවෙන් හඳුන්වනු ලබන, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ වන කාර්යය ඉටු කිරීම සඳහා, මේ නියෝග ක්‍රියාත්මක වන දින සිට මාස දොළහක වැඩිදුර කාලයක් වයඹ පළාතේ ප්‍රාදේශීය සභා වෙත මෙයින් අවසර දෙනු ලැබේ.

(2) (1) වන උප වගන්තියෙන් වැඩිදුරටත් අවසරය දෙනු ලැබූ මාස දොළහක කාලය ඇතුළත ඒ කාර්යය ඉටු කර අවසන් කිරීමට අපොහොසත් වන, මෙහි මින් මතු ''සභාව '' යනුවෙන් හඳුන්වනු ලබන වයඹ පළාතේ යම් ප්‍රාදේශීය සභාවකට, ඒ කාර්යය ඉටුකර අවසන් කිරීම සඳහා තවදුරටත් කාලය අවශ්‍ය වන්නේ නම් ඊට හේතු වූ විශේෂ අවස්ථානුගත කරුණු ඉදිරිපත් කර තවත් වැඩිදුර කාලයක් සඳහා අවසර ඉල්ලා සිටීමට ප්‍රාදේශීය සභාවලට හැකිය.

පනතේ 23 වන වගන්තිය යටතට ගැනෙන මංමාවත් හඳුනාගැනීම සහ තහවුරු කර ගැනීම කළ යුතු බව.

4. (1) පනතේ 23 වන වගන්තිය යටතේ, සභාව සතු වී ඇති ලෙස සලකනු ලැබිය යුතු, මෙහි මින් මතු ''පාර'' යනුවෙන් හඳුන්වනු ලබන පාරවල් හා පටුමාවත් හඳුනාගෙන, වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකෘතියකට සාරානුකූල ව පිළියෙල කළ ඒ පාරවල් පිළිබඳ නාම ලේඛනයක් මෙහි මින් මතු ''සහකාර කොමසාරිස්වරයා'' යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඊට ඔහුගේ එකඟතාව ලබා ගැනීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

(2) පනතේ 16 වන වගන්තිය යටතේ සභාවට පැවරුණු හෝ 17 වන වගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෝ පුත්තලම දිස්ත්‍රික්කයේ සංවර්ධන සභාව විසින් පවරා දෙන ලද නිශ්චල දේපළ අතරට ඇතුළත් වී ඇති සියලු ම පාරවල් ද, එම උපලේඛනයට ඇතුළත් කිරීමට සභාපතිවරයා විසින් ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ආකෘතියෙහි ඇතුළත් පාරවල් අතරින්, සභාව සතු වී ඇති ලෙස සලකනු ලැබීමට සහකාර කොමසාරිස්වරයාගේ එකඟතාව ලැබී ඇති සෑම පාරක් ම සම්බන්ධයෙන් වන දැන්වීම් පළ කිරීම හා ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාර්ය කිරීම මෙහි මතු දැක්වෙන නියෝගවල පටිපාටිය අනුව කළ යුතු ය.

එක් එක් පාරට අදාළ දත්ත රැස් කළ යුතු බව හා පාරවල් හඳුනා ගැනීමේ කේතයක් බැගින් වෙන් කළ යුතු බව.

5. (1) සහකාර කොමසාරිස්වරයාගේ එකඟතාව ලැබී ඇති සෑම පාරක් ම වෙනුවෙන් මෙහි පළමුවන උපලේඛනයේ ආදර්ශයට අනුව හඳුනා ගැනීමේ කේත අංකයක් බැගින් වෙන කළ යුතු ය.

(2) හඳුනා ගැනීමේ කේත අංකයක් වෙන් කළ සෑම පාරක ම, පහත සඳහන් තොරතුරු සහ ඊට අදාළ භූගෝලීය ඛණ්ඩාංක දත්ත රැස්කර ගැනීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

(i) ආරම්භක ස්ථානය සම්බන්ධ වන වෙනත් යම් පාරෙහි නම හා එම ආරම්භක ස්ථානයේ වම් පස හා දකුණු පස භූගෝලීය ඛණ්ඩාංක

(ii) එකී පාරට සම්බන්ධ වන වෙනත් යම් පාරෙහි සිට, එකී පාර විහිදී යන්නේ වම් පසට ද නැතහොත් දකුණු පසට ද වන වග

(iii) පාරෙහි ආරම්භගේ සිට සරල රේඛාවක ස්වරූපය වෙනස් වන සෑම ස්ථානයකම, එකී පාරෙහි වම් පස හා දකුණු පස භූගෝලීය ඛණ්ඩාංක

(iv) පාර හරහා ගලා යන ගඟකට, ඇලකට, දොළකට හෝ වෙනත් දිය පාරකට ඉහළින් ඉදි කර ඇත්තේ පාලමක් ද, බෝක්කුවක් ද, පෙට්ටි බෝක්කුවක් ද, දිය පැන්නුමක් ද නැතහොත් ඒ දණ්ඩක් ද යන වග හා ඒවායෙහි පිහිටීම පෙන්නුම් කරන භූගෝලීය ඛණ්ඩාංක

(v) පාරෙහි ආරක්ෂාව සඳහා ඉදිකර ඇති යම් පැති බැම්මක් හෝ වෙනත් යම් ආධාරකයක් වේ නම්, එහි ආරම්භක ස්ථානයේ හා අවසන් වන ස්ථානයේ භූගෝලීය ඛණ්ඩාංක

(vi) පාර ඔස්සේ ඉදිකර ඇති කාණුවල ආරම්භක ස්ථානයේ හා අවසන් වන ස්ථානයේ භූගෝලීය ඛණ්ඩාංක

(vii) පාර ඔස්සේ සිටුවා ඇති විදුලි කණු අතරින්, වීථි පහන් සවිකර ඇති විදුලි කණු සහ එම ස්ථානවල භූගෝලීය ඛණ්ඩාංක

(viii) ආරම්භක ස්ථානයේ සිට අවසන් වන ස්ථානය දක්වා පාර සංවර්ධනය කිරීමට යොදා ගෙන ඇති මතුපිට තලය කුමක් ද යන්න සහ එම මතුපිට තලය එකිනෙකට වෙනස් වන සෑම ස්ථානයක ම භූගෝලීය ඛණ්ඩාංක

(ix) පාරෙහි දිග මීටර්වලින්
(x) පාරෙහි සාමාන්‍ය පළල මීටර්වලින් සහ
(xi) පාරෙහි පළල වෙනස් වන සෑම ස්ථානයක ම වම් පස හා දකුණු පස භූගෝලීය ඛණ්ඩාංක

6. මේ නියෝග යටතේ පිළියෙල කරනු ලබන සෑම ලේඛනයක් ම සහ සැලැස්මක් ම, කඳවල/ශ්‍රී ලංකා යන ඛණ්ඩාංක ව්‍යුහයට අයත් භූගෝලීය ඛණ්ඩාංක භාවිතා කරමින් පිළියෙල කළ යුතු ය. කඳවල/ශ්‍රී ලංකා ව්‍යුහය භාවිතා කල යුතු බව.

7. එක් එක් පාර සම්බන්ධයෙන් රැස් කර ඇති දත්ත ආශ්‍රයෙන් දෙවන උපලේඛනයෙහි ආදර්ශයට අනුව, ඒ සෑම පාරක ම සැලැස්මක් බැගින් පිළියෙල කිරීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය. පාරවල්වල සැලැස්ම පිළියෙල කළ යුතු බව.

8. මෙහි තුන් වන උපලේඛනයේ ආකෘතියෙහි වගුවට සාරානුකූලව, සහකාර කොමසාරිස්වරයාගේ එකඟතාව ලැබී ඇති සෑම පාරක් ම පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පිළියෙල කිරීමට විධිවිධාන සැලැස්වීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය. තුන් වන උපලේඛනයෙහි වගුවෙහි දක්වා ඇති තොරතුරුවලට අතිරේක යම් තොරතුරු ඇතුළත් කිරීමට සභාවට හැකියාවක් පවතී නම්, එකී අතිරේක තොරතුරු ද ඇතුළත් වන සේ වගුවට කොටස් එකතු කිරීම කළ හැකිය. පාරවල් පිළිබඳ ලේඛනය පිළියෙළ කළ යුතු බව.

9. (1) සභාව සතු වී ඇති පාරවල් ලෙස සලකනු ලැබිය හැකි බවට සහකාර කොමසාරිස්වරයාගේ එකඟතාව ලැබී පාරවල්, සභාව සතු පාරවල් වශයෙන් පිළිගැනීමට සහ පනතේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඒ පාරවල්වල නාමලේඛනයක් *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කළ යුතු බවටත් සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කළ යුතු ය. සභාව සතු මාර්ග වශයෙන් පිළිගැනීම, ඒ පිළිබඳ දැන්වීම් පළ කළ යුතු බව සහ ඒ පාරක අයිතිය සම්බන්ධව හිමිකම් කියන පාර්ශවයක කාර්ය.

(2) (1) වන ඡේදය යටතේ සභා තීරණය ගැනීමෙන් පසුව, තුන්වන උපලේඛනයට සාරානුකූලව එම පාරවල්වල නාමලේඛනයක් ගැසට් පත්‍රයේ පළ කිරීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

(3) *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන එකී දැන්වීමෙහි ඇතුළත් යම් පාරක අයිතිය සම්බන්ධ හිමිකම් කියන යම් පාර්ශවයක් වේ නම්, පනතේ 24 වන වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන යටතේ ක්‍රියා කිරීමට එකී පාර්ශවයකට හිමිකම් තිබිය යුතු ය.

10 (1) 9(2) වන නියෝගය යටතේ වන දැන්වීමක් *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසුව, එවැනි යම් දැන්වීමක ඇතුළත් කිසියම් පාරක අයිතිය සම්බන්ධයෙන් නිසි අධිකරණයක පවරනු ලැබ ඇති නඩු සම්බන්ධ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා ගැනීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය. මාර්ගයක අයිතිය පිළිබඳ පවරා ඇති නඩු පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු බව.

(2) යම් තැනැත්තෙකු විසින් එකී යම් නිවේදනයකට අදළව අධිකරණයේ නඩුවක් පවරා ඇති බවට එම අධිකරණය විසින් සභාවට දැනුම් දෙනු ලබන නොතීසිය ලැබුණු වහාම, ඒ නඩුව පිළිබඳ තොරතුරු එකී ලේඛනයෙහි සටහන් කර තැබීමට සහ එකී නඩුව පිළිබඳ අවසාන තීරණය දක්වා සිදු වීම් අනුව කලින් කල එකී ලේඛනය යාවත්කාලීන කිරීමට විධිවිධාන සැලැස්වීම ද සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

11. (1) 9 වන නියෝගය යටතේ වන දැන්වීම මගින් නිශ්චිතව නියම කර ඇති අවසාන දිනයට පෙර ඒ දැන්වීමෙහි ඇතුළත් යම් පාරක අයිතිය සම්බන්ධයෙන් නිසි අධිකරණයක පවරනු ලැබ ඇති යම් නඩුවක දී, එකී අධිකරණය විසින් දෙනු ලැබූ තීරණයෙහි පදනම මත ඒ පාරෙහි සීමා ලකුණු වෙනස් කිරීම සහ ඒ සැලැස්මෙහි අවශ්‍ය වෙනස් කිරීමට විධිවිධාන සැලැස්වීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය. අධිකරණයේ අවසාන තීරණය අනුව අවශ්‍ය වෙනස් කිරීම් කළ යුතු බව.

12. (1) (අ) 11 වන නියෝගය යටතේ අවශ්‍ය වෙනස් කිරීම් කරනු ලැබූ පාරවල්, සහ මාර්ගවල අයිතිය තහවුරු කිරීමේ අවසාන දැන්වීම් පළ කළ යුතු බව.

(ආ) 9(2) නියෝගයේ දැන්වීමට අනුව නඩු පැවරීමක් සිදු කර නොමැති පාරවල්, සභාව සතු පාරවල් ලෙස සැලකිය යුතු බවට සහ එකී පාරවල් පිළිබඳ ලේඛනයක් *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කළ යුතු බවට යෝජනා සම්මතයක් සභාව විසින් ගනු ලැබීය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන යෝජනාව සම්මත කිරීම සහ ඒ පිළිබඳව වන දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ කිරීම, 9 වන නියෝගය යටතේ වන දැන්වීම් පළ කළ දින සිට මාස තුනක කාලයක් ගත වීමෙන් පසුව සහ මාස හයක කාලයක් අවසන් වීමට පෙර කළ යුතු ය.

(3) 9 (2) නියෝගයේ දැන්වීමට අනුව නිසි අධිකරණයක නඩු පවරා තිබූ සහ (2) වන ඡේදය යටතේ වන දැන්වීම පළ කිරීමෙන් පසු එකී අධිකරණය විසින් අවසාන තීරණයක් දී ඇති යම් පාරක් සම්බන්ධයෙන්, එකී අවසාන තීරණයෙහි නියමය අනුව අවස්ථාවෝචිත පරිදි අවශ්‍ය වෙනස් කිරීම් සිදු කර, ඒ පිළිබඳ ව වන යෝජනා සම්මතයක් ගැනීමට සභාව විසින් ක්‍රියා කළ යුතු අතර එම පාරවල් ඇතුළත් අතිරේක නාම ලේඛනයක් සහිත දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

සභාව සතු වී ඇති ලෙස සලකනු ලබන පාරවල් සහ යම් පාරක භාවිතය අවසන්

13. (1) 12 වන නියෝගය යටතේ ප්‍රකාශයට පත් කර ඇති දැන්වීමක ඇතුළත් සෑම පාරක් ම, සභාව සතු කරනු ලැබූ පාරක් ලෙස සැලකීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) සභාව සතු ලෙස සලකනු යම් පාරක්, පනතේ 24 වන වගන්තිය සහ මේ නියෝග යටතේ පාරක් ලෙස භාවිතා කිරීම අවසන්වන කවර හෝ අවස්ථාවක, 12 වන නියෝගය යටතේ පළ කළ දැන්වීමට සංශෝධනයක් පළ කිරීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

පාරවල් පිළිබඳ ලිපි ගොනුවක් සහ ඉන්වෙන්ට්‍රියක් පවත්වා ගත යුතු බව.

14. සභාව සතු කරනු ලැබූ ලෙස සලකනු ලබන සෑම පාරක් වෙනුවෙන් ම, ඒ පාර සම්බන්ධ තොරතුරු ඇතුළත් කළ ඉලෙක්ට්‍රොනික ලිපිගොනුවක් සහ ඉලෙක්ට්‍රොනික මෘදු පිටපතක පාරවල් පිළිබඳ ඉන්වෙන්ට්‍රියක් පිළියෙල කිරීම සහ අවස්ථාවෝචිත පරිදි එය යාවත්කාලීන කිරීම සභාපතිවරයාගේ කාර්ය විය යුතු ය.

අර්ථ නිරූපණය

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ නියෝගවල -

''පාර'' යන පදයට පනතේ 23 වන වගන්තිය යටතේ සභාව සතුවී ඇති ලෙස සලකනු ලැබිය යුතු පාරක්, මාවතක්, පටුමාවතක් සහ පඩි පෙළක් ද අදහස් විය යුතු අතර එවැනි කිසියම් පාරක, මාවතක, පටුමාවතක හෝ පඩි පෙළක රක්ෂිතය ද ඊට සම්බන්ධ යම් පාලමක්, බෝක්කුවක්, පෙට්ටි බෝක්කුවක්, දිය පැන්නුමක්, පැති බැම්මක්, බඳින ලද හෝ කණින ලද කාණුවක් හෝ ඒ දණ්ඩක් ද ඊට ඇතුළත් ව ඇති සේ සැලකිය යුතු ය.

''පාරක මතුපිට තලය'' යන්නෙන්, ගල් සහ තාර මිශ්‍රණයක්, අන්තර් සම්බන්ධිත ගල්, කොන්ක්‍රීට්, ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් හෝ බොරළු යොදා කරනු ලැබූ සංවර්ධන මාධ්‍යය ද,

''සභාපතිවරයා '' යන්නෙන්, මේ නියෝග යටතේ ක්‍රියා කරනු ලබන වයඹ පළාතේ යම් ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා ද,

අදහස් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

16. මේ නියෝගවල සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**පළමුවන උපලේඛනය**

5(1) නියෝගය

මාර්ග සඳහා කේත අංක වෙන් කිරීම

සභාව සතු විය යුතු ලෙස සලකනු ලබන යම් පාරක් සඳහා වෙන් කර දෙනු ලබන කේත අංකයට පහත කරුණු ඇතුළත් විය යුතු ය.

කේතය : පළාත/ප්‍රාදේශීය සභාව/පාද රේඛා මාර්ගය/පළාත් පාලන ආයතනය සතු පාර/අතුරු පාර

උදාහරණ : NWP/KUP/B247/04/00 හෝ 08

- * පළාත සඳහා වෙන් කර දෙනු ලබන කේතයට ''NWP'' යන්න යොදා ගත යුතු ය.
- * ප්‍රාදේශීය සභාව සඳහා වෙන් කර දෙනු ලබන කේතය, පළාත් පාලන කොමසාරිස්වරයා විසින් දෙනු ලබන උපදෙස් අනුව වෙන්කර ගත යුතු ය.
- * පාද රේඛා මාර්ගය යනුවෙන් අදහස් කරනු ලබන්නේ මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයකි. ඒ යම් ආයතනයක් විසින් ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කළ නිවේදනයක එකී යම් මාර්ගයක් සම්බන්ධයෙන් එකී මාර්ගයට වෙන් කර දී ඇති අංකය මේ සඳහා යොද ගත යුතු ය.
- * පාරෙහි කේතයේ ඊළඟ අංකය විය යුත්තේ පාද රේඛා මාර්ගයෙන් විහිදී යන මාර්ග අනුපිළිවෙල අනුව වෙන්කරනු ලබන අංකයක් විය යුතු ය. මේ අංකය ඉලක්කම් දෙකකින් සමන්විත විය යුතු ය.
- * මෙහි ''අතුරු පාර'' යනුවෙන් අදහස් කරනු ලබන්නේ, පළාත් පාලන ආයතනය සතු යම් පාරකින් ආරම්භ වී විහිදෙන අතුරු පාරකි. එවැනි අතුරු පාරක් වන විට මෙම කේතයෙහි අවසාන ඉලක්කම් දෙකට අංකයක් නියම කළ යුතු ය. අතුරු පාරක් නොවන පළාත් පාලන ආයතනය සතු පාරක් වන විට මෙම අවසාන ඉලක්කම් දෙක ''00 '' විය යුතු ය.

දෙවන උපලේඛනය

**7 වන වගන්තිය**

**පාරෙහි සැලැස්ම**

මාර්ග අංකය

මාර්ගයේ නම

උතුරු

බණ්
ඩාං
ක
(කඳ
වල
ශ්‍රී
ලං
කා)

සිතියම

සුචිය

උපලේඛනය

පරිමාව

දත්ත පදනම :
සකස් කළේ :
දිනය :

බණ්ඩාංක (කඳවල ශ්‍රී ලංකා)

තුන්වන උපලේඛනය
8 නියෝගය
පාරවල් විස්තරය ඇතුළත් වගුව

| අනු. අංක | පාරෙහි කේතය | පාරේ නම (ඇත්නම්) | ආරම්භක ඛණ්ඩාංකය (කඳවල/ශ්‍රී ලංකා) | | අවසාන ඛණ්ඩාංකය (කඳවල/ශ්‍රී ලංකා) | | පාරේ දිග (මීටර්) | පාරේ සාමාන්‍ය පළල (මීටර්) | මායිම් ඛණ්ඩාංක (කඳවල/ශ්‍රී ලංකා) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වම | දකුණ | වම | දකුණ | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.